ඝාතන සිදුවීමක් හා සම්බන්ධ වන දිවි තොර කරගැනීම් සුලභ නොවූවත්, බොහෝ විට ඊට මාධ්‍ය තුළ වඩා ඉහළ අවධානයක් ලැබේ. එවැනි සිදුවීම් වාර්තා කිරීමේදී ද ප්‍රවේසම් සහගත හා එවැනි සිදුවීම් වාර්තා කිරීම සඳහා නිර්දේශිත මාර්ගෝපදේශයන්ට අනුකූල ප්‍රවේශයක් අවශ්‍ය වේ. මන්දයත්, එසේ නොවන පුවත් වාර්තාවන් ඔස්සේ පවා අනුකාරක සිදුවීම් වලට මග පෑදීමට හැකියාවක් ඇති බැවිනි.

ඔස්ට්‍රේලියාවේදී ශ්‍රී ලාංකිකයෙකු විසින් සිදුකළ බවට පැවසෙන ඝාතන සිදුවීම හා දිවි තොර කරගැනීම සිංහල භාෂා පුවත්පත් හා රූපවාහිනී පුවත් තුළ වාර්තා වී ඇති ආකාරය මෙහිදී සැලකිල්ලට ගත හැක.

(අරුණ, දිවයින, මව්බිම, ලංකාදීප, ස්වර්ණවාහිනී, සිරස, Ceylon Today, The Island, Daily News, Daily Mirror, The Morning ජනවාරි 30, 31, 2022)

1) දිවි තොර කරගැනීම් වාර්තාකරණය පිළිබඳ මාර්ගෝපදේශයන්ට පටහැණි මෙවැනි වාර්තාකරණයන් ඔස්සේ, අනුකාරක සිදුවීම් වලට මග පෑදීමේ හැකියාවක් ඇතැයි ඔබ නොසිතන්නේ ද?

2) ජාත්‍යන්තර මාධ්‍ය ඔස්සේද වාර්තා වූ මෙම සිදුවීම, දිවි තොර කරගැනීම් වාර්තාකරණය සඳහා වන මාර්ගෝපදේශයන්ට අනුකූලව ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොතිබුණි ද?

විදෙස් මාධ්‍ය මගින් මෙම සිදුවීම ඉදිරිපත් කිරීමේදී, ඉහත කී දිවි තොර කරගැනීම් වාර්තාකරණය සඳහා වන මාර්ගෝපදේශයන්ට අනුව එය වාර්තා කර තිබූ බවද මෙහිදී පැවසිය යුතු වේ. (උදා: https://www.perthnow.com.au/.../huntingdale-tragedy..., https://amp.theguardian.com/.../western-australia-three...)

එසේම Ceylon Today සහ The Morning පුවත්පත්, වඩාත් මාධ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූල ආකාරයකින්, උපකාරක අංකද ඇතුළත් කරමින් මෙම පුවත වාර්තා කර තිබූ බවද ප්‍රශංසාත්මකව සඳහන් කරමු.

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

මූලාශ්‍ර:
https://media.samaritans.org/.../Samaritans_Ireland_media...
https://media.samaritans.org/.../Guidance_for_reporting...
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://www.nsrf.ie/.../Briefing_Murder-suicide_NSRF_26...